**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - 2021**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සාගර විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සාගර විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සාගර විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරී මෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම් කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සාගර විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සාගර විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | KOIKA ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ ඉදිකිරීමට නියමිත ගොඩනැගිල්ල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද රු. 1,513,936 ක් වූ මූලික වියදම් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පුහුණු වියදම් ලෙස කපාහැර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය වැඩියෙන් හා කෙරීගෙන යන වැඩ අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම දෝෂයට අදාල නිවැරදි කිරීම 2022 වර්ෂයේ අවසන් ගිණුම් තුලින් සිදු කරන බව. | අයභාර හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂය තුලදී නිරවුල් කරන ලද රු. 382,573 ක් වූ අත්තිකාරම් ශේෂය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම වටිනාකමෙන් අත්තිකාරම් ශේෂය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම දෝෂයට අදාල නිවැරදි කිරීම 2022 වර්ෂයේ අවසන් ගිණුම් තුලින් සිදු කරන බව. | නිරවුල් කරන ලද අත්තිකාරම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුළ ගැළපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂය තුළ දී කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවීම් කිරීමේදී අඩු කර ගන්නා ලද රු. 382,573 ක රඳවා ගැනිමේ මුදල රඳවා ගැනිමේ ගිණුමට බැර කිරීම වෙනුවට අත්තිකාරම් ගිණුමට බැර කර තිබුණි. | මෙම දෝෂයට අදාල නිවැරදි කිරීම 2022 වර්ෂයේ අවසන් ගිණුම් තුලින් සිදු කරන බව. | නිවැරදි කිරීම් කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 6,155,458 ක් වූ උපචිත වියදම් නිරවුල් කර තිබුණද ඊට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණිත කරුණ සම්බන්ධව එකඟවන අතර මෙවැනි දෝෂයන් ඉදිරියේ දී සිදු නොවීමට උපදෙස් ලබා දී ඇති බව. | උපචිත වියදම් නිරවුල් කිරීමට අදාල තොරතුරු ඉදිරිපත් කල යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට පැවත එන රු. 15,506,595 ක් වටිනා ලැබිය යුතු ශේෂ අයිතම 9 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේ දී මෙම ශේෂයන් නිරවුල් කර අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර සෙයදිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 573,779 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,063,873 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,490,094 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වෙනත් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පන්තිකාමර, දේශනශාලා සහ විද්‍යාගාර පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් මට්ටක්කුලිය ප්‍රධාන කාර්යාලය තුල පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී අයවැය යෝජනා යටතේ රු.මිලියන 300 ක අතිරේක ප්‍රතිපාදනයක් ලබා දී | පැවැති මූල්‍ය තත්ත්වය හේතුවෙන් භාණ්ඩාගාරයේ උපදෙස් ප්‍රකාරව ඉදිකිරීම නවතා දැමීමට සිදුවී ඇත. උසස් අධ්‍යයන ශිෂ්‍ය පහසුකම් සැපයීම සඳහා ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් බදු පදනම මත ගොඩනැගිල්ලක් | රටේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යෙදවිය යුතු මුදල් ආර්ථික නොවන ගනුදෙනු වෙනුවෙන් වැය නොකළ යුතු අතර රාජ්‍ය මුදල් ඵලදායී ලෙස උපයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කල යුතුය. |

| | |
|---|---|
| තිබුණු අතර 2016 වර්ෂයේදී ඇස්තමේන්තු සකස් කිරීම හා පාංශු පරික්ෂාව සඳහා රු.6,494,107 ක් වැයකර තිබුණි. එහෙත් විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 29 දින වන විටත් අදාල ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම දරන ලද වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. තවද එම ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු නොකර 2018 වර්ෂයේ සිට බාහිර පාර්ශවයකින් ගොඩනැගිල්ලක් කුලියට ගෙන 2021 දෙසැම්බර් 31 දින වන විට රු. 96,444,819 ක් ගොඩනැගිලි කුලී ලෙසත් ජලය, විදුලිය හා අනෙකුත් වියදම් ලෙස රු. 13,497,728 ක් ද ඇතුළුව එකතුව රු. 109,942,547 ක වියදමක් දරා තිබුණි. | ලබා ගැනීමට සිදුව ඇති බව. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අක්කර 4 ½ ක් වූ භූමි ප්‍රමාණයක පිහිටා ඇති ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මීගමුව ප්‍රාදේශීය මධ්‍යස්ථාන භූමිය පවරාගැනීමට විගණිත දිනය වූ 2022 මාර්තු 31 දක්වාම කටයුතු කර නොතිබුණි. එම භූමියේ ශ්‍රී ලංකා ආංශික සංවර්ධන ව්‍යාපෘති (SSDP) අරමුදල් යටතේ රු. 28,843,897 ක් වැයකර 2014 වර්ෂයේදී ඉදි කල නව ගොඩනැගිල්ලට අදාල කොන්ත්‍රාත්තුව නිම කිරීමෙන් පසුව එහි සහකාර අධ්‍යක්ෂ විසින් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අවස්ථා 5 කදී එහි පැවති අඩුපාඩු කොන්ත්‍රාත්කරු ලවා සකස් කර ගත යුතු බව අධ්‍යක්ෂ(පුහුණු) හා ලේඛකාධිකාරී වෙත දන්වා තිබුණි. එහෙත් එම | 2021 වර්ෂයේදී සකස් කරන ලද ඇස්තමේන්තුව අනුව ටයිල් ස්ථාපිත කිරිම හැර අනෙකුත් අඩුපාඩු සකස් කර ඇත. දැනට ටයිල් නිශ්පාදනය අඩුවීම නිසා ටයිල් නොමැතිබව කොන්ත්‍රාත්කරු දන්වා ඇති අතර ටයිල් ස්ථාපිත කල පසු භාවිතයට ගත හැකි බව. | ප්‍රාදේශීය මධ්‍යස්ථාන භූමිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. මුල් කොන්ත්‍රාත්කරු ලවා අඩුපාඩු සකස් නොකර නව කොන්ත්‍රාත්කරුවෙකු ලවා එම කටයුතු ඉටුකර ගැනීම වෙනුවෙන් දරන ලද වියදම වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අඩුපාඩු නව කොන්ත්‍රාත්කරුවෙකු මඟින් සකස් කරවා ගෙන 2021 වර්ෂයේදී රු.3,571,196 ක් ගෙවා තිබුණි. | | |
| (ආ) | මීගමුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය පිහිටි භූමියේ කොටසක අනවසරෙන් පදිංචි වී සිටින පුද්ගලයින් දෙදෙනා ඉවත් කිරීමට විගණිත දිනය වූ 2022 මාර්තු 31 දක්වාම අපොහොසත් වී තිබුණි. | මීගමුව ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ඔවුන්ට ඉවත්වෙන ලෙස ලිඛිතව දැනුම් දී ඇතත් මෙවන තෙක් ඉවත්වී නැති බව. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සාගර විශ්ව විද්‍යාලයේ මධ්‍යස්ථාන 03 ක ක්‍රියාත්මක කිරීමට හඳුන්වා දී ඇති පාඨමාලා 07 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රතීතනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මඩකලපුව මධ්‍යස්ථානයේ පාඨමාලා ප්‍රතීතනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර මට්ටක්කුලිය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ වැඩහල් නවීකරණය කිරීම හේතුවෙන් ප්‍රතීතන කටයුතු ප්‍රමාද වූ අතර ඉදිරියේදී ප්‍රතීතනය කිරීමට කටයුතු කරන බව. | ප්‍රතීතන කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකල යුතුය. |
| (ඇ) | මඩකලපුව සහ මීගමුව ප්‍රදේශිය මධ්‍යස්ථානයේ පවත්වන Diploma in aquaculture & Aquatic resource management පාඨමාලාව හා මඩකලපුව මධ්‍යස්ථානයේ පවත්වන Diploma in maritime and logistic management පාඨමාලාව සඳහා 2017න් පසු 2021 දෙසැම්බර් 31 දක්වා සිසුන් ලියාපදිංචිව නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | පාඨමාලාවන් සඳහා ප්‍රවර්ධන කටයුතු පුළුල් කල යුතුය. |
| (ඉ) | තංගල්ල ප්‍රදේශිය මධ්‍යස්ථානයේ Computer graphic designing පාඨමාලාව සඳහා 2019 වර්ෂයේ සිසුන් 19 දෙනෙකු ලියාපදිංචි වී එයින් 09 දෙනෙකු පාඨමාලාව අතහැර ගොස් තිබුණි. එම පාඨමාලාව සඳහා 2019 වර්ෂයෙන් පසු 2021 දෙසැම්බර් 31 දක්වාම සිසුන් ලියාපදිංචි වී නොතිබුණි. | 2019 දෙසැම්බර් මාසයේදී සිසුන් 19 දෙනෙකුගෙන් අරඹහ කලද 2020 වර්ෂයේ සිට ඇතිවූ කොවිඩ් - 19 වෛරස තත්වය හා මෙම පාඨමාලාව සඳහා බාහිර උපදේශකවරුන් පමණක් ලබා ගැනීම , එක් පරිගණක විද්‍යාගාරයක් පමණක් පැවතීම හේතුවෙන් පරිගණක විද්‍යාගාරය භාවිතයේදී ඇති වන ගැටලු හේතුවෙන් සිසුන් අඩුවීමට හේතුවී ඇත. | සිසුන් ලියාපදිංචි වීමට ඉල්ලුමක් ඇති පාඨමාලා පවත්වාගෙන යාමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය. |
| (ඊ) | සාගර විශ්වවිද්‍යාලය විසින් නොමිලේ පවත්වාගෙන යන උපාධි, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ ප්‍රවර්ධන කටයුතු අඩු | පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම වැඩි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ඒ අනුව ඉදිරියේදී ඒකක ශිෂ්‍ය | සියලු මධ්‍යස්ථාන සඳහා සිසුන් බඳවා ගැනීම් වැඩිකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මට්ටමක පැවතීම හේතුවෙන් මධ්‍යස්ථාන 8 සඳහා 2018, 2019 හා 2020 වර්ෂ වලදී ලියාපදිංචි කරගෙන තිබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 569, 787 හා 695 ක් විය. වැටුප් හා වේතන ඇතුලත්ව මුළු මෙහෙයුම් වියදම සැසඳීමේදී එක් ශිෂ්‍යයෙක් වෙනුවෙන් 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 686,153ක් , රු. 580,691 ක් හා රු. 670,439ක් වශයෙන් ඒකක ශිෂ්‍ය පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. | පිරිවැය අඩු වෙතැයි අපේක්ෂා කරන බව. | |
| (උ) | සාගර විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යන උපාධි පාඨමාලාවල සිසුන් සංඛ්‍යාව 4-73 අතර අඩු සංඛ්‍යාවක් වුවද පාඨමාලා දෙකක කණ්ඩායම් 11ක විභාග ප්‍රතිඵල නිකුත් කිරිම සඳහා මාස තුනේ සිට වසර 01 ත් අතර කාලයක් ගත කර තිබුණි. | ප්‍රතිඵල නිකුත් කිරීමට ගත කරනු ලබන කාලය අවම කිරිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ප්‍රතිඵල නිකුත් කිරිමේ කටයුතු කඩිනම් කිරිමට අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | පානදුර ප්‍රදේශිය මධ්‍යස්ථාන පුස්ථකාලයේ පැවති පොත් 385 සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා පරිහරණය කිරීමට 2019 අගෝස්තු 11 න් පසු කටයුතු සලසා නොතිබුණි. | 2020/2021 කොවිඩ් වසංගතය තත්වය හේතුවෙන් පාඨමාලාවල සිසුන් online තාක්ෂණය ඔස්සේ ඉගැන්වීම් කටයුතු සිදුකල බැවින් පුස්ථකාල පොත් සිසුන්ට පරිහරණය කිරිමට ලබා දීමට නොහැකි වී ඇති බව. | කොවිඩ් වසංගත තත්වය නිසා අඛණ්ඩව රට වසා නොතිබුණු අතර සිසුන්ට පුස්තකාලය පරිහරණයට ඉඩ පහසුකම් ලබාදිය යුතුය. |
| (එ) | මීගමුව විද්‍යාලයේ ජල ජීවී වගා හා ජලජ සම්පත් කළමනාකරණ පාඨමාලාව සඳහා උපදේශකවරු 6 දෙනෙකු අනුමත වී තිබියදී උපදේශකවරියක් පමණක් බඳවාගෙන තිබුණි. පාඨමාලා කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා ඇය 2017 වර්ෂයේ ප්‍රසූත නිවාඩු ලබාගන්නා අවස්ථාවේ සිට වර්තමානය දක්වා වෙනත් ස්ථිර උපදේශකවරයෙකු අනුයුක්ත කිරීමට කටයුතු නොකර ඇය උසස් අධ්‍යාපන අංශයේ කථිකාචාර්යවරියක ලෙස 2018 ජුලි සිට අනුයුක්ත කිරීමට පාලන අධිකාරිය විසින් කටයුතු කර තිබුණි. | 2016 කණ්ඩායම අධ්‍යයන කටයුතු ඉතා අපහසුතා මධ්‍යයේ කොන්ත්‍රාත් පදනම මත වරින් වර ලබා දුන් උපදේශකවරුන්ගේ දායකත්වයෙන් අවසන් කල අතර 2018 වර්ෂයේ ආරම්භ කළ පාඨමාලාවද අවසන් කිරීමට කටයුතු සැලසුම් කර ඇති බව. | මධ්‍යස්ථාන අධ්‍යක්ෂකවරුන්ගේ ඉල්ලීම් කෙරෙහි කළමනාකරණය අවධානය යොමුකර පාඨමාලා විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. |
| (ඒ) | පෞද්ගලික ආයතනවල නිෂ්පාදිත බෝට්ටු දියත් කිරීම සඳහා සාගර විශ්වවිද්‍යාලය සතු මීගමුව විද්‍යාලයේ ජැටිය යොදාගැනීම වෙනුවෙන් එක් බෝට්ටුවකට රු. 10,000 බැගින් විශ්වවිද්‍යාලය අය කරන බැවින් | පිළිතුරු ලබා දි නොමැත. | මායිම් වෙන්කර හඳුනාගෙන ආදායම් විධිමත්ව ඉපයීම සඳහා අවශ්‍ය විධි විධාන යෙදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආදායම් උත්පාදනය සඳහා යොදාගත හැකි මෙම ජැටිය බාහිර පාර්ශවයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා සාගර විශ්වවිද්‍යාලය විසින් මායිම් වෙන්කර ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඔ) | SSDP ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් හා නවීකරණය කරන ලද මීගමුව විද්‍යාලය පවත්වාගෙන යන පැරණි ගොඩනැගිල්ලේ වැද්දුම් ශිල්පී වැඩපල පවත්වාගෙන යාම සඳහා වෙන්කර තිබූ කාමරයේ ටයිල් නොකිරීම හා වහලයේ OPEN AREAහි තෙමෙන කොටස් 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සකස් නොකිරීම හේතුවෙන් වැඩපල ආරම්භ කිරීමට හා පාඨමාලාව ආරම්භකර පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි. | SSDP ව්‍යාපෘතිය යටතේ නව ගොඩනැගිල්ලේ වැද්දුම් ස්ථානයක් නොමැති අතර, පරණ ගොඩනැගිල්ලේ වැද්දුම් වැඩහලක් ලෙස නවීකරණය කිරීම සඳහා වෙන් කර ඇත. එහි අලුත්වැඩියා කටයුතු මේ වන තෙක් සිදුවී නොමැති බව. | ඉල්ලුමක් පවතින පාඨමාලා ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඕ) | මීගමුව ප්‍රාදේශීය මධ්‍යස්ථානයට පරිගණක විද්‍යාගාරයක් සඳහා ස්ථානයක් වෙන්කර 2016 වර්ෂයේ සිට පරිගණක 10 ක් වරින් වර ඉල්ලුම් කර තිබුණද සිසුන්ගේ පාඨමාලා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පහසුකම් ලබාදීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.<br>පරිගණක විද්‍යාගාරය භෞතිකව පරීක්ෂා කිරීමේදී 2016 වර්ෂයේ දී SSDP ව්‍යාපෘතියෙන් ලබාදී තිබුණු පරිගණක මේස 10 ක් සහ පුටු 10 ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව තබා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පාඨමාලාවන් විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය උපකරණ ලබා දී පාඨමාලාවල ගුණත්වය වර්ධනය කර පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ක) | මීගමුව මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන out board motor mechanic පාඨමාලාව සඳහා උපදේශකවරුන් 06 දෙනෙකු අනුමත වී තිබුණද වර්තමානයේ දී එක් බාහිර උපදේශකවරයෙකුගේ සහභාගීත්වයෙන් පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ. මෙම උපදේශකවරයා නොමැති අවස්ථාවලදී පාඨමාලාව පවත්වාගෙන යාමට නොහැකි වීමෙන් පාඨමාලාව අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගත වීම සහ පාඨමාලාවේ ගුණාත්මකභාවය අඩු වීමට සෘජුව බලපෑමක් විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | අත්‍යවශ්‍ය කාර්යමණ්ඩලය බඳවාගෙන පාඨමාලා විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය විධි විධාන යෙදිය යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීගමුව විද්‍යාලය සතු ජැටියේ නැංගුරම් දමා ඇති, යාත්‍රා දෙකක් 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම නිශ්ක්‍රියව පැවතුනද යාත්‍රා මුර කිරීම සඳහා විද්‍යාලයේ සේවකයන් දෙදෙනෙකු යොදවා මුර සේවා කටයුතු සඳහා වසරකට රු. 200,000 කට වැඩි මුදලක් ගෙවා තිබුණි. | ප්‍රධානයන් මත ලැබී ඇති මෙම යාත්‍රා උපයෝජනය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් පවතින අතර මෙම යාත්‍රා සම්බන්ධව යාත්‍රාවරණයට යෝග්‍යතාවය පරික්ෂා කර නිර්දේශ ලබා ගැනිම සඳහා රේඛිය අමාත්‍යාංශ ලේකම් විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිළධාරීන් ඇතුළත් වන පරිදි කමිටුවක් පත් කර ඇති බව. | 2004 වර්ෂයේ ලැබුණු යාත්‍රා වර්තමානය දක්වාම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කළමනාකරණය වගකිව යුතුවේ. එම යාත්‍රා සිසු අධ්‍යයනය සඳහා ක්‍රමානුකූල විෂය ධාරාවක් යටතේ යෙදවීමට අවශ්‍ය විධි විධාන යෙදිය යුතුය. |
| (ආ) | SSDP ව්‍යාපෘතිය යටතේ නවීකරණය කරන ලද මීගමුව විද්‍යාලය පවත්වාගෙන යන පැරණි ගොඩනැගිල්ලේ වෑද්දුම් ශිල්පී වැඩපල පවත්වාගෙන යාම සඳහා 2014 වර්ෂයේ වෙන්කර තිබූ කාමරයේ පැවති අඩුපාඩු සකස් නොකිරීම හේතුවෙන් 2022 මාර්තු 31 දක්වාම වැඩපල හා පාඨමාලාව ආරම්භකර පවත්වාගෙන යාමට නොහැකි වීම නිසා එම පාඨමාලාව සඳහා මිලදී ගෙන තිබූ පිරිවැය රු. 1,595,745 ක් වූ වෑද්දුම් උපකරණ වර්ග 18 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | මෙම උපකරණ වලින් කොටසක් දැනට පාඨමාලා පවත්වාගෙන යන විද්‍යාලවල අවශ්‍යතා මත භාවිතය සඳහා යොමු කර ඇති බව. | රජයේ අරමුදල්භාවිතා කර ගෙන මිලට ගෙන ඇති උපකරණ සිසුන්ගේ අධ්‍යාන කටයුතු සඳහා උපයෝජනය කළ යුතුය. |

## 3.4 වාහන පද්ධතිය කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පානදුර මධ්‍යස්ථානය භාරයේ පවතින 2019 දෙසැම්බර් 02 දිනට 89 km ක් ධාවනය කර තිබූ නිසාන් සනී මෝටර් කාර් රථයේ එන්ජිම අලුත්වැඩියාව සඳහා 2019 වර්ෂයේ රු. 141,950 ක ඇස්තමේන්තුවක් ලබා ගෙන | අදාල වාහනය අපහරණය කිරීමට තීන්දු කර ඇති බැවින් හා අළුත්වැඩියාව ඵලදායී නොවන බැවින් අදාල ගරාජයෙන් නැවත | තීරණ ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම මත වාහන දිරාපත් වීම සිදුවන බැවින් එම තීරණ ක්‍රියාත්මක නොකරන නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | තිබුණද 2022 ජනවාරි වන විට වසර 2 කට අධික කාලයක් අලුත්වැඩියා නොකර මධ්‍යස්ථාන භූමියේ නවතා දමා තිබුණි. 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. | රැගෙන එන ලද බව. | සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ආ) | තවත් මෝටර් කාර් රථයක පැද්දුම් හා එළවුම් පද්ධතිය හා වායු සමීකරණ පද්ධතිය අක්‍රීය වීම හේතුවෙන් 2021 නොවැම්බර් සිට ධාවනයෙන් ඉවත් කර තිබුණි.<br>වාහන අළුත් වැඩියා ප්‍රමාදයකින් තොරව සිදු නොකිරීම නිසා ධාවනය කරන ලද වාහන පනගැන්වීමකින් තොරව දීර්ඝ කාලයක් තිබීම හේතුවෙන් වාහන වල එන්ජිම ඇතුළු අනෙකුත් කොටස් අක්‍රීය තත්වයට පත් වී සක්‍රීය ජීව කාලය අඩුවන අතර වාහන අඩු උපයෝජනයකින් අපහරණය කිරීමට සිදු විය හැක. | ප්‍රදේශයේ ලියාපදංචි ගරාජ 3කින් මිල ගණන් ලබා ගෙන අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය වෙතින් අළුත්වැඩියාව සිදු කලද අදාල ගෙවීම් සිදු කිරීමට නොහැකි වීම මත ගරාජයෙන් වාහනය නිදහස් කරගැනීමට නොහැකිව තිබූ බව. | වාහන පරිපාලන කටයුතු ඉතා දුර්වල තත්වයක පවතින බැවින් මේ පිළිබඳව කළමනාකාරිත්වයේ අවධානය යොමුවිය යුතුය. |